# ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

# පුරප්පාඩු

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව රජයේ රෝහල් සඳහා අවශ්‍ය ඖෂධ හා ශල්‍ය උපකරණ ආනයනය කරන එකම රාජ්‍ය ආයතනය වන අතර, පුද්ගලික අංශය සඳහා ඖෂධ ආනයනය කර බෙදාහැරීමේ ප්‍රමුඛතම ආයතනය ද වේ.

අප ආයතනය පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා පහත පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. කළමනාකරණ සහකාර (තත්ත්ව පාලන සහකාර) - (MA 2.1) III වන ශ්‍රේණිය

**සුදුසුකම්**

(අ) රසායන විද්‍යාව විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව අ.පො.ස. (උ/පෙළ) විභාගය විද්‍යා විෂය ධාරාවෙන් සමත් වීම

සමග

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් රසායන විද්‍යාව ප්‍රධාන විෂයක් ලෙසට වූ විශ්වවිද්‍යාල උපාධියක්

හෝ

(ආ) රසායන විද්‍යා විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව අ.පො.ස. (උ/පෙළ) විභාගය විද්‍යා විෂය ධාරාවෙන් සමත්ව සිටීම

සමග

Institute of Chemisttry Ceylon හි රසායන විද්‍ය උපාධි වැඩසටහන සම්පූර්ණ කොට තිබීම.

**වැටුප් පරිමාණය** : රු. 37,890/- 375/- X 10, 440/- X 7,620 X 4, 825/- X 20 - 63,700/- (දළ වශයෙන් මාසික වේතනය රු. 115,914/- ක් පමණ වනු ඇත)

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා බලානොපායි)

## 02. කළමනාකරණ සහකාර (නිෂ්පාදන සහකාර) - (MA 1.1) III වන ශ්‍රේණිය

**සුදුසුකම්**

(අ) (i) අ.පො.ස. / (සා/පෙළ) විභාගයෙන්, දෙවරකට නොවැඩි වාර ගණනකදී, සිංහල / දෙමළ, ඉංග්‍රීසි, ගණිතය සහ තවත් එක් විෂයක් ඇතුළත්ව සම්මාන හතරක් සහිතව විෂයන් 06 කින් සමත්ව සිටීම.

සහ

(ii) අ.පො.ස. (උ/පෙළ) (නව විෂය නිර්දේශය) විභාගයෙන් (පොදු ප්‍රශ්න පත්‍රය හැර) රසායන විද්‍යාව විෂයය ඇතුළත්ව අවම වශයෙන් විෂයයන් 02 කින් සමත්ව සිටීම

හෝ

(ආ) (i) අ.පො.ස (උ/පෙළ) (පැරණි විෂය නිර්දේශය) විභාගයෙන් විෂයයන් 03 කින් සමත්ව සිටීම.

සහ

(ii) පරිගණක සාක්ෂරතාවය

සහ

(iii) රජයේ / රාජ්‍ය සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක නිෂ්පාදන කාර්යයන් පිළිබඳ වසර 03 ක පශ්චාත් සේවා පළපුරුද්ද

**වැටුප් පරිමාණය** : රු. 34,890/- 375/- X 10, 440/- X 7, 620 X 4, 825/- X 20 - 60,700/- (දළ වශයෙන් මාසික වේතනය රු. 110,458/- ක් පමණ වනු ඇත)

**වයස් සීමාව** : වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා බලානොපායි)

**අයදුම්කරුවන්,**

i. ශ්‍රී ලාංකිය පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරේ රාජකාරි නිසියාකාරව කිරීමට අවශ්‍ය කායික හා මානසික ශක්තිය තිබිය යුතුය.

iii. සුපිළිපත් චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුය.

තෝරා ගත් අයදුම්කරුවන් හට මාසික පැමිණීමේ දිරි දීමනාව, ලබා නොගත් නිවාඩු සඳහා මුදල් ප්‍රතිපූර්ණය, වාර්ෂික ප්‍රසාද දීමනා, සුබසාධන ප්‍රතිලාභ, වෛද්‍ය ප්‍රතිලාභ හා සේවකයාට හා පවුලේ අය සඳහා රෝහල් ගත වීමේ වෛද්‍ය රක්ෂණාවරණය ඇතුළත්ව ප්‍රතිලාභ රැසක් හිමි වේ.

අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ ජීව දත්ත සමග අයදුම්පතෙහි, වයස, සුදුසුකම්, පුහුණුව, සේවා පළපුරුද්ද, වත්මන් තනතුර, වැටුප හා වැටුප් පරිමාණය, දරන ලද පෙර තනතුරු හා පෙර සේවා යෝජකයන්ට සම්බන්ධ වූ සහ ඉවත් වූ දිනයන් යන කරුණු ඇතුළත් කොට **ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්, සහතිකවල පිටපත් සහ ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග යොමු කළ යුතුය. අදාළ සහතිකවල පිටපත් නොමැතිව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කරුණාවෙන් සලකන්න.**

රජයේ / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවයේ නියුතු අයදුම්කරුවන් තමඅයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය. අයදුම්පත් බහාලූ ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

**පොදු කොන්දේසි :**

01. අයදුම්කරු සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අදාළ සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් බාර ගන්නා අවසන් දිනය වන විට සෑම අතින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

02. ඉහත ක්‍රම වේදයෙන් බැහැරව යොමු කරනුලබන සෑම අයදුම්පතක්ම ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වේ.

03. අයදුම්පතෙහි සපයා ඇති සියලුම තොරතුරු නිවැරදි හා සම්පූර්ණ බවට අයදුම්කරු විසින් සහතික වියයුතුය.

04. සෑම අයදුම්කරුවකුම විශිෂ්ට චරිතයකින් සහ විනයානුකූල ක්‍රියාමාර්ගයකින් වරදකරුවකු නොවූ අයෙකු විය යුතුය.

05. අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව අයදුම්පත් කැඳවීමෙන් පසුව ඒ ඒ තනතුරට අදාළ වන පරිදි වූ ලිඛිත විභාගයක් හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

06. පුරප්පාඩු සුළු සංඛ්‍යාවක් සඳහා විශාල සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණ සඳහා සුදුසුකම් ලැබූ විට එම සංඛ්‍යාව 25 ට වැඩි වන අවස්ථාවලදී සෑම පුරප්පාඩුවකටම පස් දෙනෙකු වන අනුපාතයට සම්මුඛ පරීක්ෂණවලට කැඳවීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙහි පත් කිරීමේ බලධාරියාට හැකිය.

07. මෙම නිවේදනයේ ඇතුළත් නොවන යම් කරුණක් හෝ බඳවා ගැනීමේ ක්‍රියාවලියේ දී පැන නගින ඕනෑම ගැටලුවක් සම්බන්ධයෙන් අවසාන තීරණය ගනු ලබන්නේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. තවද අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අවසාන තීරණය වනු ඇත.

සියලුම අයදුම්පත් 2026.07.06 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුය.


**වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන),**
**ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව,**
**"මෙහෙවර පියෙස", 16 වන මහල, නො. 41,**
**කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05.**
**දුරකථන අංකය : 0112320356-9**